# මාගම රජ පෙළපතේ දේශපාලනික අභිවර්ධනය

**පී.එම්.යූ. ප්‍රේමරත්න**

සහකාර කථිකාචාරිනී, ඉතිහාස අධ්‍යයන අංශය

**manjuhis88@gmail.com**

**සංක්ෂේපය**

මාගම රාජධානියේ ඉතිහාසය බොහෝ ඈතට දිව යයි. රෝහණ ක්ෂත්‍රියා විසින් රෝහණය පිහිට වූ බව වංසකථාවන්හි දක්වෙතත් ඔහුගේ අග නගරය කුමක් ද යන්න කිසි තැනෙක නො දක්වේ. ඒ අනුව මාගම පළමුවරට සිය රාජ්‍ය මධ්‍යස්ථානය බවට පත් කරගනු ලැබුවේ දේවානම්පියතිස්ස සහෝදර මහානාග නම් උපරජු විසින් බව මූලාශ්‍රයේ එන තොරතුරුවලින් අනාවරණය කරගත හැකි ය. මාගම රාජධානියේ ඓතිහාසිකත්වය සහ එහි දේශපාලනික අභිවර්ධනය සිදුවූ ආකාරය පිළිබඳ මෙහිදී විමර්ශනය කෙරේ. මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදී ථූපවංශය, ධාතුවංශය, බෝධිවංශය, සද්ධර්මාලංකාරය, පූජාවලිය වැනි මූලාශ්‍රය බෙහෙවින් වැදගත් විය.

**මාගම රාජධානියේ ආරම්භය සහ දේශපාලනික අභිවර්ධනය**

ඓතිහාසික මාගම ශ්‍රී ලංකාද්වීපයේ කඩඉම්පොතේ **'මාගම් රට'** ලෙස ද, ලක්වීදියේ **'මාගම්මඬුල්ල'** ලෙස ද, ත්‍රී සිංහලේ කඩඉම්පොතේ **'මාගංනුවර' හා 'මාගම්පත්තුව'** ලෙස ද හැඳින්වෙයි. රුහුණේ පැරණි ම ප්‍රදේශ බෙදීම අනුව මාගමට වැදගත් තැනක් හිමිවිය (අභයවර්ධන, 1996, පි.118). රාජාවලිය මාගම හඳුන්වා ඇත්තේ **'මාගම් නුවර'** වශයෙනි. එනම්, පණ්ඩුවාසුදේවගේ සොහොයුරෙක් වූ කාශ්‍යප කුමරු මාගම් නුවර වාසභූමිය ලෙස යොදාගත් බව යි (**රාජාවලිය**, 1997, පි.195).

අනුරාධපුර රාජවංශයට අයත් මහානාග නම් උපරජු දේවානම්පියතිස්ස රජුගේ බිසව වූ අනුලා දේවියගේ කුමන්ත්‍රණ නිසා රෝහණයට පලා ගොස් මාගම රාජධානිය මුල් කොටගෙන රාජ්‍ය විචාළ බව මහාවංසයේ සඳහන් වේ (**මහාවංසය**, 1996, 22:2-8). ඒ අනුව උපරාජ මහානාග රුහුණට ඊශ්වරයා ලෙස මහත් සම්පත් ඇති ව මාගම වෙසෙමින් රාජ්‍ය ගෙනගොස් තිබේ. නමුත් රෝහණයට පැමිණි උපරාජ නාග රෝහණයේ ඊශ්වරයා මෙන් බලය භුක්ති විඳි බවක් නො පෙනේ (රාජිණී, 2014, පි.47). වංසත්ථප්පකාසිනියට අනුව මහානාග උපරජු සිය අඹුදරුවන් සහ සේනාව ද රැගෙන රුහුණට පලාවිත් මුළු රෝහණයේ ම පාලකයා බවට පත් වූයේ ය (**වංසත්ථප්පකාසිනී**, 2001, පි.224). මාගම මුලින් ම ගොඩනැගුණේ මහානාගගෙන් යැයි අනුමාන කළ හැකි ය. මාගම යන නාමය සෑදී ඇත්තේ **මහානාග ගාම = මහගාම = මාගම** යනුවෙන් ක්‍රමික ව විකාශනය වීමෙන් බව ඇතැම් වියතුන් පවසයි (ද සිල්වා, 1988, පි.7).

කෙසේ වෙතත් මහාවංස කතුවරයා මාගම රාජධානියේ ආරම්භය දේවානම්පියතිස්ස යුගයට සම්බන්ධ කළ ද මෙහි ආරම්භය ඊට වඩා අතීතයට දිව යයි. ඒ අනුව මහාචාර්ය විමල විජේසූරිය මහතාගේ මතය වන්නේ අනුරාධ ආදී අනෙකුත් ක්ෂත්‍රියන් මුල් ජනාවාස පිහිටුවා ගත් ආකාරයට ම රෝහණ නමැති අමාත්‍යයා, කිරින්ද නදිය අසබඩ පිහිටුවා ගත් රාජධානිය මහාග්‍රාමය බව යි (විජේසූරිය, 1987, පි.16). මෙය සත්‍යයක් නම් රෝහණයේ මුල් ම රාජධානිය වන්නේ ද මහාගාම හෙවත් මාගම යි. සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරන්නේ කතරගම සිට සැතපුම් අටක් දුරින් මාගම පිහිටි බව යි (ලං.වි.ලං.ඉ., 1964, පි.142). මාගම වූ කලී වත්මන් තිස්සමහාරාමය ලෙස හඳුනාගෙන ඇත (ගුණසිංහ, 1968, පි.31).

මහානාග කුමරු රෝහණයේ මාගම සිට රාජ්‍ය විචාළ බව සියලු මූලාශ්‍රයන්හි දක්වෙතත් ඔහු සිය පරපුරේ ම අනුයාතකයන් භාවිතා කළ **'මහරජ'** යන අභිධානය හෝ යටත් පිරිසෙයින් **'රජ'** යන අභිධානය ව්‍යවහාර නො කළේ ය (ද සිල්වා, 1988, පි.7). රුගම් සෙල්ලිපියේ මහානාග හඳුන්වා ඇත්තේ **'උවරජ නක'** යනුවෙනි. කෙසේ වෙතත් මහානාගගෙන් පසු මාගම රාජධානියේ

අනුප්‍රාප්තිකයා බවට පත් වූයේ යටාලතිස්ස රජු ය. මෙම රාජ්‍යයේ ව්‍යාප්තිය ආරම්භ වූයේ මෙම රජුගෙන් බව සිතිය හැකි ය. ඔහු තම පියා මෙන් උපරජ යන අභිධානයෙන් සෑහීමට පත් නොවී '**මහරජ**' යනුවෙන් තමාව හඳුන්වා ගැනීම මේ සඳහා කදිම නිදර්ශනයකි.

මහානාගගෙන් පසු මාගම රාජධානියේ බලයට පත් වූයේ යටාලතිස්ස රජු ය. පූජාවලිය හැර සෙසු සියලු ම වංශකථාවල සඳහන් ව ඇත්තේ ඔහු මාගම වෙසෙමින් රෝහණයේ රාජ්‍ය විචාළ බව යි.

**"ඒ යටාලතිස් රජ කැලණි පහය ඇතුළු වූ**

**කැලණි වෙහෙර කරවා එහිම රජය කළේ** "

(**පූජාවලිය**, 2007, පි.771)

යැයි පූජාවලියේ සඳහන් වේ.

මහාවංසයට අනුව නම් මහානාගගෙන් පසු ඔහු පුත් යටාලතිස්සත්, ඉන් පසු ඔහු පුත් ගෝඨාභයත්, ඉන්පසු ඔහු පුත් කාවන්තිස්සත් ආදී වශයෙන් රජ බවට පැමිණුනු බව සඳහන් වේ. නමුත් මෙය සත්‍යයක් ම නොවන බවට ශිලාලේඛන සාධක ඉදිරිපත් කළ හැකි ය. රුහුණේ මාගම් පත්තුවේ දෙයියන්නේකෙම නම් වූ ස්ථානයෙන් හමුවූ දෙවන හෝ තුන්වන සියවසට අයත් ශිලාලේඛනයක යටාලතිස්ස, නාග නම් උපරජුගේ පුතෙකු බව සඳහන් වන අතර රුගම්හි තිබෙන ශිලාලේඛනයක ද යටාලතිස්ස, මහානාග නම් උපරජුගේ පුත්‍රයෙකු බව සඳහන් වේ. ඒ,

**"උවරජ මහනකශ පුත යටලක තිශ මහරජ"**

(**University of Ceylon Review,** vol.ii, p.238-239)

යනුවෙනි. මේ අනුව විවාදයක් නොමැතිව ම යටාලතිස්ස වූ කලී මහානාග උපරජුගේ පුත්‍රයෙකු බව පිළිගත හැකි ය. ගැටලුව වන්නේ එය නොවේ. එනම්, කුසලාන කන්දෙන් හමුවී ඇති ශිලාලේඛනයක සඳහන් වන පරිදි අභය නමැති රජ කෙනෙකු නාග උපරාජයාගේ පුත්‍රයෙකු බව සඳහන් වීම නිසා ඇතිවන තත්ත්වය යි (**J.R.A.S.,** 1957, p.145).

මෙහි එන අභය ගෝඨාභය ලෙසට ඇතැම් විද්වතුන් පිළිගෙන ඇති අතර (ගුණසිංහ, 1968, පි.32) එය සත්‍යයක් නම් යටාලතිස්ස සහ ගෝඨාභය යන දෙදෙනා දෙසොහොයුරන් මෙන් ම නාග හෙවත් මහානාග උපරජුගේ පුතුන් ය. ඒ අනුව සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරන්නේ මෙමගින් අනාවරණය වන්නේ පිය පුතු පරම්පරාවක තතු නොව, සොයුරන් ගැන බව යි (**History of Ceylon,** vol.i , p. 154).

ඒ අනුව මහාවංසයේ සඳහන් වන පරිදි මහානාගගේ පුතු යටාලතිස්ස පමණක් නොවන බවත් මොවුන් දෙදෙනා පිය පුතුන් නොව, සොහොයුරන් බවත් පැවසේ. නමුත් මෙම යටාලතිස්ස සහ ගෝඨාභය යන දෙදෙනා පිය පුතුන් බව සහ ඔවුන් දෙසොහොයුරන් නොවන බවට සිරිමල් රණවැල්ල මහතා කරුණු ඉදිරිපත් කර තිබේ. එනම්, මාගම රජ පෙළපතේ ආරම්භක පාලකයා මහානාග වුවත් මොට්ටයාකල්ලු ලිපියේ සඳහන් වන්නේ මහානාග කෙනෙක් පිළිබඳ ව නොව නාග නමැත්තෙක් පිළිබඳ ව යි. එහෙයින් එය සාවද්‍ය බව ඔහු පෙන්වා දේ. මෙහි එන නාග කුමරු දසබෑ රජුන්ගේ කණිෂ්ඨතම පුත්‍රයා බව ද ඔහු කියාපායි (රණවැල්ල, 2003, පි.56). එමෙන් ම නක මහරජුගේ සිතුල්පව් පර්වත ලිපියේ, කාවන්තිස්ස රජු යටාලතිස්ස රජුගේ මුණුපුරෙක් බව සඳහන් වේ (රණවැල්ල, 2003, පි.56). ඒ අනුව ගෝඨාභය රජුගේ පුතා ය. එමෙන් ම යටාලතිස්ස රජු තමා මහානාග යුවරජුගේ පුතෙක් බව ස්වකීය සෙල්ලිපිවල දක්වා ඇත්තාක් මෙන් ගෝඨාභය ද, ඔහුගේ පියා මහානාග වී නම් එසේ සඳහන් නොකළේ ඇයි ද යනත් පිළිබඳවත් ඇතැම් විද්වතුන් සැක පළ කරයි (ද සිල්වා, 1988, පි.11). මෙම කරුණු නිසා ඉහත මතය ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව රණවැල්ල මහතා පෙන්වා දේ.

කෙසේ වෙතත් යටාලතිස්සගෙන් පසු ගෝඨාභය මාගම රාජත්වයට පත් ව තිබේ. නිවැරදිව ම රෝහණයේ බල ව්‍යාප්තිය ආරම්භ වන්නේ ගෝඨාභයගේ රාජ්‍යපද ප්‍රාප්තියත් සමග ය. මොහු මාගම පරපුරේ එඩිතර හා දූරදර්ශී පාලකයෙකු ලෙස වංසකථා හඳුන්වයි. ඇතැම් උගතුන් විශ්වාස කරන්නේ මාගම රජ පෙළපතට අයත් මහානාග සහ යටාලතිස්ස යන දෙදෙනා ම කතරගම ක්ෂත්‍රියන්ගේ යටත් පාලකයන් වශයෙන් සිටින්නට ඇති බවත් වෙහෙර විහාර තැනවීමාදිය සිදුකරන ලද්දේ ඔවුන්ගේ අනුදැනුම මත බවත් ය.

නමුත් ගෝඨාභය රජු මෙසේ අවනත ව කටයුතු කිරීමට අකමැති වූවා විය හැකි ය. එනම්, ධාතුවංසයෙන් අනාවරණය වන පරිදි ගෝඨාභය රජු රෝහණ රාජ්‍යයේ පැරණි ම රජ පවුලක් වූ කතරගම දසබෑ රජවරුන් සමග කෙළින් ම යුද වැදී ඔවුන් මරා දමා තිබේ. මාගම හා කතරගම පාලකයන් අතර මහානාග යුවරජු දවස සිට ගොඩනැගෙමින් පවතින්නට ඇතැයි සිතිය හැකි දේශපාලන තරගය උච්ඡාවස්ථාවට පත් වූයේ රෝහණයේ අසහාය නායකත්වය ලබාගැනීම සඳහා මුහුණට මුහුණ දී සටන් කළ මේ අවස්ථාවේදී බව සැලකිය හැකි ය. කෙසේ වෙතත් මෙම සිද්ධිය නිසා කළකිරුණු රජු මහවැලි ගඟ දෙපස විහාර පන්සියය බැඟින් කරවා තිබේ (**ධාතුවංසය**, 1941, පි.23). සිරිමල් රණවැල්ල මහතා පවසන්නේ සේන ගුත්තික ආක්‍රමණය හමුවේ කතරගම දසබෑ රජවරුන් මාගම රජවරුන්ගේ ආධිපත්‍යයෙන් මිදී ස්වාධීන ව එම ප්‍රදේශ පාලනය කිරීමට පෙළඹීම නිසා ගෝඨාභය රජු මෙවැනි ක්‍රියාමාර්ගයක් ගත් බව යි (රණවැල්ල, 2003, පි.57).

කෙසේ වෙතත් ගෝඨාභය රජුගේ බලය විශාල ප්‍රදේශයක් පුරා පැතිරුණු බව සිතිය හැකි ය. මාගම මුල් කරගෙන රෝහණය එක්සත් කිරීම සඳහා ගෝඨාභයගෙන් සැලකිය යුතු සේවයක් සිදුවූ බව කිව හැකි ය. මාගම මුල් කරගත් පාලක පරම්පරාව ගෝඨාභය රජුගේ කාලය වනවිට අඩු ම තරමින් දිගාමඩුල්ල තෙක්වත් තම බලය ව්‍යාප්ත කර ගන්නට ඇතැයි සිතිය හැකි ය (ඉලංගසිංහ, 2003, පි.177). සැබැවින් ම ගෝඨාභය සිය පූර්වයාතකයන් දෙදෙනාට ම වඩා බලවත් ව සිටි බව පිළිගැනීම සාධාරණ ය.

ගෝඨාභයගෙන් පසු ව මාගම රජ පෙළපතේ බලයට පත්වූයේ ඔහු පුත් කාකාවණ්ණතිස්ස හෙවත් කාවන්තිස්ස යි. කතරගම සහ මාගම රාජවංශ දෙක එක්සත් කළේ ඔහු ය. එනම් කාවන්තිස්ස විවාහ වූයේ කතරගම රාජවංශයට අයත් වූ විහාර දේවිය සමග යි (**මහාවංසය**, 2014, 22:22). මෙම විවාහය ආකස්මික ව සිදුවූවක් බව වංසකථාවේ දැක්වුණ ද ඇතැම් උගතුන්ගේ මතය වන්නේ කතරගම සහ මාගම රජ පෙළපත් දෙක එක්සත් කිරීමේ බලාපොරොත්තුවෙන් මෙම විවාහය සිදුවූ බව යි. එමෙන් ම ධාතුවංසයේ කැලණියේ ශිවගේ සහෝදර ගිරි අභයට කාවන්තිස්ස රජුගේ සොහොයුරිය වූ සෝමා දේවිය විවාහ කර දීම පිළිබඳ ව දක්වා තිබේ. මෙහි එන ශිව රජු කැලණිතිස්ස රජුගෙන් පසු කැලණියේ රජ කළ බව පරණවිතාන මහතා අනුමාන කරයි (ලං.වි.ලං.ඉ., 1964, පි.145). කෙසේ වෙතත් යට කී සිදුවීම ද ඉහත සම්බන්ධතාව තහවුරු කිරීමක් ලෙස ගත හැකි ය (**ධාතුවංසය**, 1941, පි.30). මෙම විවාහ සම්බන්ධතා තුළින් කතරගම සහ මාගම රජ පෙළපත් දෙක එක්සත් වූහ.

කාවන්තිස්ස රජු සිය බලය මහවැලි ගං මෝය දක්වා ව්‍යාප්ත කළේ ය. ධාතුවංසයට අනුව කාවන්තිස්ස රජු තමන් සතු ව තිබෙන ධාතූන් වහන්සේ නමක් ඔහු විසින් ම සේරු නගරයේ ස්තූපයක නිධන් කරනු ලැබෙති යැයි බුදුන් වහන්සේ විසින් දේශනා කළ බව රජුට දැන ගන්නට ලැබුණු අතර රජු එය රෝහණයේත්, සේරු හා ගිරි නුවරවලත් ප්‍රචාරය කරන ලදී. ඒ අනුව රජු ගැමුණු කුමරු මාගම ද, තිස්ස කුමරු දීඝවාපියේ ද නවත්වා සේරු රාජ්‍යයට ගොස් එම සත් කාර්යය සිදු කරමින් සිය බලය මහවැලි ගං මෝය දක්වා ව්‍යාප්ත කරන ලදී.

මාගම රජ පෙළපතේ අවසාන පාලකයා වූයේ දුටුගැමුණු යි. පිය රජු මළ පසු ගැමුණු කුමරු මාගම සිංහාසනය ලබාගැනීමට ගිය ද සිය සොහොයුරා සමග සටන් වැදීමට ඔහුට සිදුවිය. කෙසේ වෙතත් අවසන ඔහු රාජත්වයට පත්වීමෙන් අනතුරු ව ද්‍රවිඩ විරෝධී සටන මාගමින් ඇරඹී ය. සිංහල ජාතිය හා ආගම දුබල වෙමින් තිබියදී එය වළක්වා ගත්තේ මාගම රෝහණ රාජ්‍යයෙන් බිහිවූ නරවරයෙකි. උපරාජ මහානාගගෙන් ආරම්භ වූ රෝහණයේ මාගම පරපුරේ බලය දුටුගැමුණු රජ දවස උච්ඡස්ථානයට පත්විය.

ඒ අනුව මාගම එක් කලෙක රෝහණයේ අගනුවර විය. උපරාජ මහානාගගේ සිට දුටුගැමුණුගේ රාජ්‍යෝදය දක්වා වූ අඩ සියවසකට මදක් වැඩි කාලයක් රෝහණයේ රාජධානිය වූයේ මාගම යි. ඒ අනුව එළාර පාලනය අතුගා දමා දුටුගැමුණු රජු රට එක්සේසත් කළ පසු අනුරාධපුරය අග නගරය බවට පත්වූ අතර ඒ සමග මාගම අරාජික විය.

මාගම රජ පෙළපතේ ආරම්භකයා වූ මහානාග සාමකාමී ප්‍රතිපත්තියක් ගෙන ගිය ද යටාලතිස්ස හා ගෝඨාභය යන දෙරජුන් එයට තරමක් වෙනස් වූයේ ආක්‍රමණශිලී ප්‍රතපත්තිය අතිනි. එයිනිදු කැපී පෙනෙන්නේ ගෝඨාභය යි. ඉන්පසු කාවන්තිස්ස රජු මුළු රෝහණ රාජ්‍යය ම එක්සත් කරන ලද්දේ මාගම මුල් කරගනිමිනි. එමෙන් ම ඔහු පුත් දුටුගැමුණු මාගම මුල් කොටගෙන දියත් කළ ද්‍රවිඩ විරෝධී සංග්‍රාමීය ව්‍යාපාරය නිසා මුල් වරට ලංකාව ම එක් සේසතක් යටතට ගෙන ඒමට හැකියාව ලැබුණි. ඒ අනුව අඳුරු යුගයකදී මාගම රජ පරපුරින් බිහිවූ සේවාව ලංකා ඉතිහාසයේ අමරණීය වේ. එමෙන් ම ආගමික අංශය ගත්ත ද විශිෂ්ට ආගමික ප්‍රබෝධයක් මාගමට අයත් ප්‍රදේශයේ එවකට පැවති බව සනාථ වේ.

## නිගමනය

සමස්තයක් වශයෙන් සලකා බලන විට ලංකා ඉතිහාසයේ කලින් කල බලයට පත් ප්‍රාදේශීය රාජවංශ සියල්ල ම අතර ඉතා වැදගත් වූ රට දැය වෙනුවෙන් ඉමහත් සේවාවක් ඉටු කළ රාජවංශයක් ලෙස මාගම රාජවංශය සැලකිය හැකි ය. ක්‍රි.පූ. 247 පමණ වන දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයේ ඇරඹි මාගම රජ පෙළපතේ එළාර රජුගේ අවසානය දක්වා කාල පරිච්ඡේදය ගත් කල මාගම රජ පෙළපතට අයත් පාලකයෝ සිව්දෙනෙකි. එනම්, ක්‍රි.පූ. 247 සිට 161 දක්වා වූ වර්ෂ 86 ක් තුළ මෙම පාලකයන් රාජ්‍ය පාලනය ගෙන යන ලදී. විශේෂයෙන් ම එහි වැදගත්කම රඳා පවතින්නේ සියවසකට ආසන්න කාලයක් ගතවීමට ප්‍රථම එම පරපුර මගින් ඉටුවූ අනගි මෙහෙය නිසාවෙනි. රටට ජාතියට ආගමට ජාතික ආරක්ෂක මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමට මාගම රජ පරපුර ගත් උත්සාහය ප්‍රශංසා කටයුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

ධාතුවංසය, (1941), පියරතන හිමි, මකුළුදූවේ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

පූජාවලිය, (2007), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රකාශනය.

මහාවංසය, (2014), ශ්‍රී සුමංගල නාහිමි, දේවරක්ෂිත පඬිතුමා, බටුවන්තුඩාවේ, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

රාජාවලිය, (1997), සුරවීර,ඒ.වී., අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වංසත්ථප්පකාසිනී, (2001), අමරවංස නාහිමි, අකුරටියේ, දිසානායක, හේමචන්ද්‍ර, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

### ද්විතීයික මූලාශ්‍රය

අභයවර්ධන, එච්.ඒ.පී., (1996), කඩඉම්පොත් විමර්ශනය, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

ආටිගල, නිකලස් සහ වෙනත් අය, (1964), ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, 1 කාණ්ඩය, 1 භාගය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ප්‍රකාශනය.

ඉලංගසිංහ, මංගල, (2003), මහාවංසය හා ශ්‍රී ලංකාවේ ඉතිහාස සම්ප්‍රදාය, තරංජී ප්‍රින්ටර්ස්.

ගුණසිංහ, පී.ඒ.ටී., (1968), පුරාතන රෝහණ රාජ්‍යය, දීපානි ප්‍රකාශකයෝ.

ද සිල්වා, සුමනදාස, ඇම්.බී., (1988), මාගම රාජ්‍යයේ ව්‍යාප්තිය, ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය.

රණවැල්ල, සිරිමල්, (2003), පුරාතන රෝහණ රාජ්‍යය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

රාජිණී, ඒ.අයි., (2014), සිංහලේ ආරක්ෂක බලකොටුව ඓතිහාසික රෝහණය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

විජයසූරිය, විමල, (1987), රුහුණේ අප්‍රකට පුරාවෘත්ත, තරංජී ප්‍රකාශන.

History of Ceylon, Vol.I

Journal of the Royal Asiatic Society, (1957).

University of Ceylon Review, Vol.II